**අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 1 - 2014**

-----------------------------------------------------------------------

අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර 1 හි 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස්එල්-පී 110 දරන ණය ගිවිසුමේ ව්‍යාපෘති අවබෝධතාවයෙහි 14 පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උතුරු අනුරාධපුර ප්‍රදේශයේ ජල සැපයුම් පද්ධතියක් ඉදිකිරීම මගින් බීමට සුරක්ෂිත ජලය සහ ජල සැපයුම් ප්‍රදේශ වැඩිකිරීම තුළින් ප්‍රදේශයේ සනීපාරක්ෂකභාවය හා සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 11,515 කට සමාන ජපන් යෙන් මිලියන 6,817 ක් වූ අතර ඉන් රු. මිලියන 8,726 කට සමාන ජපන් යෙන් මිලියන 5,166 ක් හෝ සියයට 75.78 ක් ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී ඇති අතර රු. මිලියන 2,789 කට සමාන ජපන් යෙන් මිලියන 1,651 ක් හෝ සියයට 24.22 ක ඉතිරි වටිනාකම ශ්‍රී ලංකා රජය විසින් දායකත්වය සැපයීමට අපේක්ෂිත විය. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 පෙබරවාරියේදී ආරම්භ කළ අතර 2018 පෙබරවාරියේදී අවසන් කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි.ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම්

තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරික්ෂා කිරීම්ද පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**-----------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 මතය**

**---------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

**2. 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**---------------------------------------**

**2.2.1 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්**

**--------------------------------------------**

ව්‍යාපෘතිය සතු දේපල, යන්ත්‍ර සහ පිරියත වල භෞතික පැවැත්ම තහවුරු කිරීමට මුදල් රෙගුලාසි අංක 756 ප්‍රකාරව 2014 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි.

**2.2.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොතිබීම**

**--------------------------------------------**

ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් මාරු කරන ලද රු. මිලියන 14.8 ක් ව්‍යාපෘතියේ සේවක පාරිශ්‍රමික ලෙස ගිණුම් ගත කර තිබුණි. මූලික වැටුප, දීමනා හා අඩු කිරීම් ආදී තොරතුරු ඇතුළත් විස්තරාත්මක උපලේඛනයක් නොමැති වීම හේතුවෙන් ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට ගෙවන ලද පාරිශ්‍රමිකයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

-------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-----------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය කිරීමට එකඟ වූ වටිනාකම | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ ප්‍රතිපාදනය | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
| | ජ. යෙන් (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | ජ.යෙන් (මිලියන) | රු. (මිලියන) | ජ.යෙන් (මිලියන) | රු. (මිලියන) |
| ජ.අ.ස.නි | 5,166 | 8,726 | 290.00 | 202.18 | 246.00 | 202.18 | 246.00 |
| ශ්‍රී.ලං.ර | 1,651 | 2,789 | 73.10 | 49.56 | 60.22 | 66.72 | 81.07 |
| **එකතුව** | **6,817** | **11,515** | **363.10** | **251.74** | **306.22** | **268.90** | **327.07** |

ඉහත තොරතුරු අනුව, ණය ප්‍රතිපාදනයෙන් සියයට 4 ක අරමුදල් පමණක් 2014 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඊළඟ වසර 03 ක කාලය තුළ ණය ප්‍රතිපාදනයෙන් සියයට 96 ක අරමුදල් භාවිතා කිරීමේ හැකියාව පිළිබඳව ගැටළුකාරී වන බව පෙන්නුම් කෙරිණි.

### 3.2 භෞතික කාර්යසාධනය

---------------------------

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(අ) නියමිත කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘති අරමුණු සපුරාගැනීම තහවුරු කරගැනීමට සමස්ථ ව්‍යාපෘති කාලය ආවරණය වන පරිදි වගකීම් නිශ්චය කිරීම් සහිතව මාසික, කාර්තුමය, අර්ධ වාර්ෂික ආදී වශයෙන් භෞතික හා මූල්‍ය ප්‍රගතිය උද්දීපනය කරමින් පුළුල් විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතු වුවත් එවැනි සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. එම නිසා ව්‍යාපෘති කාර්ය සාධනය කාලානුරූපී ආකාරයෙන් සොයා බැලීමට නොහැකි වූ අතර පවතින දූර්වල කාර්ය සාධනය හේතුවෙන් නිශ්චිත ව්‍යාපෘති කාලය තුළ අරමුණු ළඟා කර ගැනීම අවිනිශ්චිත වේ.

(ආ) ඉදිරිපත් කළ තොරතුරු අනුව, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වර්ෂය තුළදී ප්‍රමාද වී ආරම්භ කර තිබුණි. එමනිසා සැලසුම් සකස් කිරීම හා පටිපාටි සකස් කිරීමේ පහසුකම්, ජල පිරිපහදු කිරීමේ යන්ත්‍ර, භූගත ටැංකි හා කුළුණු ආදිය සඳහා ටෙන්ඩර් ලියකියවිලි වැනි

මූලික වැඩ සමාලෝචිත වර්ෂය තුළදී සිදු කර තිබුණු අතර එවැනි වැඩ වලින් සියයට 53 ක් 2014 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි.

(ඇ) ව්‍යාපෘති තත්ත්ව වාර්තාවේ 2.2 ව්‍යවස්ථාවට අනුව, 2013 සැප්තැම්බර් වලට පෙර ව්‍යාපෘතිය සඳහා උපදේශකයෙක් තෝරා ගත යුතුව තිබුණද උපදේශක සේවා සඳහා කොන්ත්‍රාත්තුව මාස 09 ක ප්‍රමාදයකින් 2014 ජූනි 13 දින වනවිට පිරිනමා තිබුණි.

**3.3 මතභේදයට තුඩු දෙන කරුණු**

------------------------------

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියෙහි පරිපාලන වැඩ සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සිටියද පරිචයක් ලෙස, ව්‍යාපෘති සේවක පාරිශ්‍රමිකය ගණනය කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් සිදුකර එසේ ගණනය කළ වැටුපෙන් සියයට 20 ක් පොදුකාර්යය වියදම් ලෙස ව්‍යාපෘතියෙන් අය කරයි.ව්‍යාපෘතිය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත 2014 වර්ෂය සඳහා එසේ ගෙවන ලද පොදුකාර්ය වියදම රු.517,193 ක් විය.

(ආ) 2014 අගෝස්තු 22 සිට 24 දක්වා කොළඹදී පැවති ප්‍රජා සහ ජල සේවා තුන්වන ජාත්‍යන්තර සමුළුව සඳහා ව්‍යාපෘතිය රු. මිලියන 2 ක් වැය කර තිබුණද එවැනි වියදමක් ව්‍යාපෘති ක්‍රියාකාරකම් වලට අදාල නොවුනි. අදාල වියදම ශ්‍රී ලංකා රජයෙන් ලද දායකත්වයෙන් අඩුකර මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කර තිබුණි.